බස්නාහිර පළාත් සභාවේ, පළාත් සභා පාසල්වල පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පති තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම්.

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු නාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති, පහත සඳහන් පාසල්වල පුරප්පාඩුව පවතින විදුහල්පති තනතුර සඳහා, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ III/II ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ III/II ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් නොලැබුණ හොත් පමණක්, ඒ සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යාවේ III/II ශ්‍රේණියේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සළකා බලනු ලැබේ. එසේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ හෝ විශේෂ සේවක සංඛ්‍යාවේ III/II ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් නොලැබුණේ නම් පමණක් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සළකා බලනු ලැබේ.

	පාසල
I.	බප/කොා/ලින්ඩ්සේ බාලිකා විද්‍යාලය
II.	බප/කොා/සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහා විද්‍යාලය
III.	බප/පිළි/උසස් බාලිකා විද්‍යාලය
IV.	බප/පිළි/ ශ්‍රීමත් ජෝන් කොතලාවල විද්‍යාලය
V.	බප/පිළි/ ලලිත් ඇතුළත්මුදලි විද්‍යාලය
VI.	බප/කැල/ මහාමායා බාලිකා මහා විද්‍යාලය
VII.	බප/කැල/ දරණගම මහා විද්‍යාලය
VIII.	බප/මීග/ මුදලිදු ඩේවිඩ් මෙන්ඩිස් මහා විද්‍යාලය
IX.	බප/කළු/ ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලය
X.	බප/කළු/ පානදුර රාජකීය මහා විද්‍යාලය
XI.	බප/ජය/ මහරගම ජනාධිපති විද්‍යාලය
XII.	බප/ජය/ කොට්ටාව ධර්මපාල මහා විද්‍යාලය
XIII.	බප/ජය/ මාලඹේ ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
XIV.	බප/කැල/ කිරිල්ලවල මධ්‍ය මහා විද්‍යාලය
XV.	බප/ගම්/ කිරිදිවැල මධ්‍ය මහා විද්‍යාලය
XVI.	බප/කැල/ කරුණාරත්න බෞද්ධ මහා විද්‍යාලය
XVII.	බප/හෝමාගම මධ්‍ය මහා විද්‍යාලය

03. විදුහල්පති තනතුර සඳහා සුදුසුකම් -

- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ / විශේෂ සේවක සංඛ්‍යාවේ, III ශ්‍රේණියේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූරණ කරන ලද නිලධාරියෙකු වීම හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
- අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2026.07.21 දිනට පූර්වාසන්න වසර 05 තුළ දී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතු අතර, එම වසර 05 තුළ දී සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.
- සෑම අයදුම්කරුවකුම තම තනතුරේ සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

04. තෝරාගනු ලබන ක්‍රමවේදය -

ඉහත 03 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පදනම්ව ලකුණු ලබා දෙන අතර, එම ලකුණු මත පදනම්ව ඉහළම ලකුණු ලබා ගත් නිලධාරියා අදාළ තනතුරට තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ. (ආදර්ශ අයදුම්පත්‍රය හා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය මේ සමඟ අමුණා ඇත.)

05. නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කල යුතු වේ.

06. ඒ අනුව, මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ කලාප අධ්‍යාපන කාර්යාලයේ හා ඒ යටතේ වන ආයතනයන්හී සේවය කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් දැනුවත් කර, මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් නිසි ධුරාවලිය මඟින් **2026.07.21 දින හෝ ඊට පෙර** "ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (බස්නාහිර පළාත් සභාව), අංක. 204, ඩෙන්සිල් කොඩිබෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට SPEED POST/ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට කටයුතු කරන ලෙස දැනුවත් කරන්නේ නම් මැනවි.

07. නිලධාරීන් විසින් පාසල් කිහිපයක් සඳහා ඉල්ලුම් කරනු ලබන්නේ නම්, ඒ සඳහා අයදුම්පත් වෙන් වෙන් ව ඉදිරිපත් කළ යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති ලේඛන ද ඒ අනුව වෙන් වෙන් ව ඉදිරිපත් කළ යුතු ය.

08. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. **අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර,** පත් කිරීම් සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සතුවේ.

09. එසේම, යම් නිලධාරියෙකු උක්ත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් එම නිලධාරියා අදාළ පරිපාලන බලධාරියා වෙතින් බස්නාහිර පළාත් සභාව වෙත නිදහස් කරවා ගැනීමට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ට මැදිහත් විය නොහැකි බවද සැලකුව මැනවි.

ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත.